කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී දෙවන වසර පරීක්ෂණය - දෙවන සෙමෙස්තරය - 2018

SOC 1202 – මනෝ විද්‍යාවේ මූලධර්ම

පැ දෙකයි (02)

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

1. 'ව්‍යුහවාදී හා කෘත්‍යවාදී යන පර්යාලෝක දෙකම මිනිස් මනස අධ්‍යනය කිරීමේ ක්‍රමයක් ලෙස අන්තරාවලෝකනය යොදා ගනියි'. මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.

2. මානව චර්යාවේ පවත්නා සාමාන්‍ය හා අසාමාන්‍ය ලක්ෂණ අවබෝධ කරගැනීමෙහි ලා ජීව විද්‍යාත්මක පර්යාලෝකයෙහි ඇති වැදගත්කම මානව චර්යාවේ අසාමාන්‍යතා ඇති වීම කෙරෙහි බලපෑම් කරන හේතු කාරක හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

3. විශ්විද්‍යාලයේ දී ඔබට නියමිත පැවරුමකට අදාළ ව දත්ත එකතු කිරීම සඳහා ඔබ වෙල්යායක් අසලින් වැටී ඇති අඩි පාරක් දිගේ ගමන් කරමින් සිටියි. හදිසියේම ඔබ ගමන් කරන මාර්ගය ඉදිරියට කුපිත වූ ගවයෙකු පැමිණෙනු ඔබ දකියි. ඉහත සඳහන් අවස්ථාවේදී ඔබ දක්වන ප්‍රතිචාර අවබෝධ කරගැනීමෙහි ලා ජේම්ස්-ලැන්ග් න්‍යාය හා කැනන්-බාර්ඩ් න්‍යාය ඔබ සහාය කරගන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

4. **එක්කෝ**

ෆ්‍රොයිඩ් ඉදිරිපත් කළ මනෝ ලිංගික වර්ධන අදියර ඇසුරෙන් පුද්ගල පෞරුෂය ධනාත්මක හෝ ඍණාත්මක ආකාරයෙන් වර්ධනය වන්නේ කෙසේදැයි උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

**නැතහොත්**

'මනෝ සමාජ සංවර්ධනය පිළිබඳ එරික් එරික්සන්ගේ න්‍යාය ළදරුවියේ සිට වැඩිහිටි විය දක්වා විවිධ අවධි තුළ පුද්ගලයා අත්දකින අනන්‍යතා අර්බුදයේ ප්‍රතිඵල විස්තර කරයි. මෙම ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? සාකච්ඡා කරන්න.

*අ.පි.බ.*

5. දරුවන් තුළ ආක්‍රමණශීලී චර්යා රටාවක් වර්ධනය වීම කෙරෙහි ආක්‍රමණශීලී හා ප්‍රචණ්ඩකාරී දර්ශන සහිත වීඩියෝපට නැරඹීම ඇතිකරන බලපෑම පිළිබඳ මනෝ විද්‍යාත්මක පර්යේෂණයක් සිදු කිරීමට ඔබගේ මනෝ විද්‍යා ආචාර්යවරිය ඔබට උපදෙස් දී ඇත.

    i. මේ සඳහා ඔබ උපයෝගී කරගන්නා පර්යේෂණ විධික්‍රමය සඳහන් කර එම විධික්‍රමය ඔබ තෝරා ගත්තේ ඇයි දැයි පැහැදිලි කරන්න.

    ii. තෝරාගත් පර්යේෂණ විධික්‍රමයේ ශක්තීන් හා දුර්වලතා විස්තර කර එම දුර්වලතා මඟහරවා ගැනීමට හැකි යෝජනා ඉදිරිපත් කරන්න.

6. සීනු නාදයකදී කෙසෙල් ගෙඩියක් ආහාරයට ගැනීමට ඔබ වඳුරෙක් පුහුණු කරන්නේ කෙසේදැයි, ඉගෙනුම පිළිබඳ න්‍යායන් ඇසුරින් විස්තර කරන්න.

7. 'අප බාහිර ලෝකය අවබෝධ කරගන්නේ සංවේදනය හා සංජානනය හරහා ය.' සංවේදන පද්ධතියේ/ඉන්ද්‍රියන්ගේ කෘත්‍යයන් ඇසුරෙන් උදාහරණ දක්වමින් මෙම ප්‍රකාශය විස්තර කරන්න.

8. පහත දැක්වෙන ඕනෑම මාතෘකා <u>**දෙකක් (02)**</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

    i සංජානක නියතතා (Perceptual Constancies)

    ii ස්කිනර්ගේ සම්පර්යේෂණය (බළලෙකු ඇසුරෙන් සිදුකළ සම්පරීක්ෂණය කෙරෙහි විශේෂ අවධානය සහිතව)

    iii ප්‍රජානනය (Cognition)

    iv මාස්ලෝගේ අවශ්‍යතා ධූරාවලිය

*************